
# රට නව පුනරුද යුගයකට:

# අභිමානවත් 77 වැනි නිදහස් දින සමරුවෙන්....





**ජයසිරි මුණසිංහ**

අතීතයේ සිදුවූ වැරදි ගොන්නක් නිසා අද වනවිට සෑම අතින්ම බිඳ වැටී ඇති 'ශ්‍රී ලාංකේය ජාතිය සහ රට සැවොම එකට එක්ව නව පුනරුද යුගයකට රැගෙන යමු' යන ගෞරවාන්විත ආරාධනාව සහිත ජීව ගුණය සහ ප්‍රාණය පුරා පැය දෙක හමාරක් ජනහදවත්වලට එක් කළා වූ 77 වැනි ජාතික නිදහස් දින සැමරුම් මහෝත්සවය නාස්ති-කාර වියදම්වලින් තොරව, ජනතා සහභාගි-ත්වය සහිතව ජනාධිපති අනුර කුමාර දිසා-නායක මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ - 07, නිදහස් චතුරස්‍රයේදී ඊයේ (04) චාම් නමුත්, අභිමානවත් අන්දමින් පැවැත්විණි.

ආර්ථික, දේශපාලන, සාමාජිය හා නන්විධ ක්ෂේත්‍ර ඔස්සේ සැබෑ නිදහසේ අරුත එකසේ විඳ දරා ගැනීමට සමත් පොහොසත් ජාති-යක් නිර්මාණය කිරීමට අතිශයින්ම වැදගත් ක්‍රියාමාර්ග මොනවාදැයි පණිවිඩයක් සේ කැටිකොට ගනිමින් ජාතිය හමුවේ තැබීමට සිය ජාතිය ඇමතීමේ කතාව තුළින් මෙහිදී ජනාධිපතිවරයා වගබලා ගත්තේය.

ජාතික පුනරුදයකට පෙළගැසෙන ලෙස සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජාතිකත්වයන්ගෙන් සහ බෞද්ධ, හින්දු, ඉස්ලාම් සියලු ආගමිකයන්ගෙන් සියලු වාද භේද දුරලා එක්වීමේ ඇති දැඩි වුවමනාව ද ජනාධිපතිවරයා මෙහිදී ජනහදවත්වලට කා වැද්දීමට ක්‍රියාකළේය. බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් ආගමික නායකයන්ගේ සහභාගිත්වය මෙවර උලෙළට එක් කළේ ශක්තිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ දැඩි අව-ශ්‍යතාවයි.

එපමණක් නොව ආදිවාසී නායක ඌරු-වරිගේ වන්නිලඇත්තෝ; අප මාතෘභූමියේ අතීත උරුමක්කරුවන්ගේ පෙළපත නියෝ-ජනය කරමින් මේ උත්සවයට එක්ව සිටීම සැමගේ සිත් සතුටු කිරීමට ද හේතුවිය. පක්ෂ, විපක්ෂ දේශපාලනඥයෝ මෙන්ම රාජ්‍යතාන්ත්‍රිකයන් ද විශාල පිරිසක් මෙවර නිදහස් දින සැමරුමට සහභාගි වී සිටීම කැපී පෙනිණි.

ප්‍රෞඪ ශ්‍රී ලාංකේය ජාතියේ අතීත උරු-මය ද, අනාගත ශ්‍රී ලංකාවේ දිශානතිය ද මනාව වටහා ගනිමින් ඒ ජාතියේ උපනුපන් දූ - දරුවන්ගේ, වැඩිහිටියන්ගේ සිත්වලට කාවැද්දීමට බල කළ අසිරිමත් නිදහස් සැම-රුම් උලෙළක් ලෙස මෙවර පැවති උලෙළ ආරම්භවූයේ අග්‍රවිනිශ්චයකාර මුර්දු නිරූපා බිදුෂිණී ප්‍රනාන්දු මැතිනියගේ සම්ප්‍රාප්තියත් සමඟිනි. අනතුරුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහ-තාගේ පැමිණීම සනිටුහන් විය.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමැති ආචාර්ය ඒ.එච්.එම්.එච් අබයරත්න, නියෝජ්‍ය ඇමැති පී. රුවන් සෙනරත් මහත්වරු මීට එක්වූහ. ඔවුන් විසින් අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ඇමැති ආචාර්ය හරිනි අමරසූරිය මෙණෙවිය පිළිගනු ලැබීය. අගමැතිනිය පොලිස් යතුරුපැදි කණ්ඩායම් පෙරටුව උලෙළට සහභාගි වූ අතර ජනාධිපති අනුර කුමාර දිසා-නායක මහතා යුද හමුදා පොලිස් සේවා බළකා යතුරුපැදි කාණ්ඩය පෙරටුව පෙරවරු 8.00ට උලෙළට සම්ප්‍රාප්ත විය.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නර්තන කණ්ඩායම මංගල බෙර වාදනය කළහ. අනතුරුව ජනපතිවරයා විසින් ජාතික ධජය ඔසවන ලදී. ඔහු කොඩි කණුව සහිත පීඨිකාව වෙත කැටුව යෑම ත්‍රිවිධ හමුදාපතිවරු සහ වැඩ-බලන පොලිස්පතිවරයා විසින් සිදු කරනු ලැබීය. කොළඹ ප්‍රධාන පාසල් නවයක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 44දෙනකු විසින් ජාතික ගීය ගායනා කරන ලදී.









ජාතික නිදහස් දින සැමරුම් උලෙළට සුබ පතමින් ජය මංගල ගාථා සහ "දේවෝ වස්සතු කාලේන" ගාථාව කොළඹ ප්‍රධාන කාන්තා පාසල් තුනක ශිෂ්‍යාවෝ 16 දෙනෙක් ගායනා කළහ. ඉන් අනතුරුව අප මාතෘ භූමියේ ස්වාධීනත්වය, භෞමික අඛණ්ඩතාව, ස්වෛරීභාවය ඇති කිරීම උදෙසා දිවි පිදූ සියලු ශ්‍රී ලාංකිකයන් අනුස්මරණය කිරීමට විනාඩි දෙකක නිශ්ශබ්දතාවක් පැවැ-ත්විණ. අනතුරුව ජනපතිවරයා වෙත ත්‍රිවිධ හමුදා සම්මාන මුරය සහ උත්තමාචාරය පිරිනැමිණි.

ජනපතිවරයා ජනතා සහභාගිත්ව නිදහස් දින සැමරුමක් සංවිධානය කිරීමට මුලසිටම බලධා-රීන්ට උපදෙස් ලබාදී තිබිණි. ඉන් අනතුරුව ඊට එක්වූ සියලු දෙනා ඇමතීමට කටයුතු කළේය.

ජනපතිවරයාගේ ජාතිය ඇමතීමෙන් අනතුරුව යුද, නාවික, ගුවන්, පොලිස්, සිවිල් ආරක්ෂක බළකා සහ ජාතික ශිෂ්‍ය භට බළකායන්හි වීර වික්‍රමාන්විතභා-වය ජාතිය හමුවේ ප්‍රදර්ශනය කරමින් සම්මාන පෙළපාළිය පැවති අතර එය අරඹමින් ත්‍රිවිධ හමුදා සාමාජිකයෝ 100ක් යෝධ ජාතික ධජ රැගෙන අභිමානවත්ව පෙරට යෑම සිදුවිය.

මේ සම්මාන පෙළපාළිය "ජාතික පුනරුදයට පෙළ ගැසෙමු" යන්න තේමා කරමින් පැවැත්වූ අතර, රැස්ව සිටි සර්ව ආගමික නායකයන්ගේ, පක්ෂ විපක්ෂ දේශපාලනඥයන්ගේ, රාජ්‍ය නිලධා-රීන්ගේ, දෙස් විදෙස් රාජ්‍යතාන්ත්‍රික-යන්ගේ අත්පොළොසන් මැද සහ නෙතට සතුටු කඳුළු එක් කරවමින් එය අභිමා-නවත්ව ශ්‍රී ලාංකේය ආරක්ෂක හමුදා-වන්ගේ ප්‍රතාපවත් බව සහ නොසැලෙන ජීව ගුණය විහිදුවාලන ලෙස ඉදිරිපත් කෙරිණි.

අප මාතෘ භූමිය ආරක්ෂා කර ඉහළ තලයකට ගෙන ඒමට ලේ, දහඩිය, කඳුළු පුද කර මේ වනවිට විශ්‍රාම සුවයෙන් පසු-වන ත්‍රිවිධ හමුදා ප්‍රවීණයෝ 77 දෙනෙක් සැමරුම් උලෙළ හා එක්වෙමින් ඊට සිය ගෞරවය පුද කළහ. තම ජීවිතය පරදු-වට තබා උපන් මාතෘ භූමියට ණය නොවී ජාතියේ ආරක්ෂාව සැපයීමට නිර්භී-තව ක්‍රියා කර දැනට ආබාධිතව සිටින රණවිරුවන් කිහිප දෙනෙකු රැගත් රථය සංදර්ශන මාර්ගයේ ගමන් ගන්නා විට උලෙළට සහභාගි වූවෝ සිය අසුන්වලින් නැඟිට සිය ගෞරවය පුද කළහ. එය නෙත සතුටු කඳුළක් එක් කළ කෘතගුණ සැලකීමේ ගුණය සිහිපත් කළ සංවේදී මොහොතක් විය.

මෙරට නිදහසේ ගෙවී ගිය දශක 7කට අධික කාලයේ අප පැමිණි ගමන්මගේ සමාජ, ආර්ථික, දේශපාලන දුර්භාග්‍ය-යන්ගෙන් වඩාත්ම පීඩාවට පත්වූයේ මවුවරුන්ය. උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත්, කඳුකරයේත් මව්ව-රුන්ගේ බලාපොරොත්තු කඩවීම් සහ අහිමිවීම් බිඳලා අනාගතයේ අප මාතෘ භූමියේ ගොඩනැඟීම මනාවට පිළිඹිබු කළ සංස්කෘතික සංදර්ශනය ඇරඹියේ ඉන් අනතුරුවය. මේ සංස්කෘතික සංදර්ශනය මෙරට සාම්ප්‍රදායික උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් සම්මිශ්‍රණය කළ එකක් විය. එය මුස්ලිම් නර්තනාංගයන්, සාම්ප්‍රදායික බටහිර සංගීතය සමඟ මුසුවූ මෙරට සාම්ප්‍රදායික ජන ගී ද ඇතු-ළත් කර සැකසූ නව්‍ය මුහුණුවරකින් යුතු සංගීත රසයක් මුසුකොට ඉදිරිපත් කළ මනබන්දනීය, කන්කලු, සංගීතාස්වාදයක් එක් කළ ප්‍රසංගයක් බඳුවිය.

උලෙළ අවසානයේ ජාතික ගීය දමිළ බසින් ගායනා කෙරිණි.

ශ්‍රී ලාංකේය ජාතිය සතු ප්‍රෞඪත්වයට නවී-නත්වය මුසු කොට කිසිම ජාතියකට නොදෙ-වැනි ආකාරයට සෑම ආකාරයකින්ම පෙරට ආ යුතු යැයි පොදු ජනතාවට බලාපොරොත්තු සහ අපේක්ෂා දැල්වූ විචිත්‍ර උලෙළක් ලෙස මෙවර නිද-හස් දින සැමරුම පැවැත්වීම කාගේත් කතාබහට ලක්වූ සුවිශේෂී අවස්ථාවක් වූ බව සනිටුහන් කළ යුතුය.

**ඡායාරූප-සුලෝචන ගමගේ, චින්තක කුමාරසිංහ, වාසිත පටබැඳිගේ ජනාධිපති මාධ්‍ය අංශය**





## උණවටුන





ඡායාරූප - හිනිදුම රවීන්ද්‍ර ලියනගේ

## යාපනය





යාපනය දිස්ත්‍රික් කාර්යාල භූමියේ පැවැති නිදහස් උත්සවයේදී....

## ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර



